# මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අධ්‍යයන වර්ෂය 2020/2021 වෙනුවෙන් මොරටුව විශ්වවිද්‍යාල මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය

**වාස්තු විද්‍යා උපාධි පාඨමාලාව, නිර්මාණවේදය උපාධි පාඨමාලාව, භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය) විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව (ඉංජිනේරු පීඨය), තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය ( තොරතුරු තාක්ෂණ පීඨය) යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා යෝග්‍යතා පරීක්ෂණවලට අයදුම් කිරීම**

1. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ඇතුළත් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අත් පොතෙහි අංක 1.2 දරණ කොටස යටතේ සඳහන් කර ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් පහත සඳහන් යෝගතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| **(i)** | **වාස්තු විද්‍යාවේදී උපාධි පාඨමාලාව** | **(වි.වි. අත් පොත/පරිච්ඡේද අංක 2.2.8.6)** |
| **(ii)** | **නිර්මාණවේදී ගෞරව උපාධි පාඨමාලාව** | **(වි.වි. අත් පොත/පරිච්ඡේද අංක 2.2.8.9)** |
| **(iii)** | **භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව** | **(වි.වි. අත්පොත/පරිච්ඡේද අංක 2.2.8.8)** |
| **(iv)** | **විලාසිතා නිර්මාණය හා නිපැයුම් ප්‍රවර්ධනය** | **(වි.වි. අත් පොත/පරිච්ඡේද අංක 2.2.8.7).** |
| **(v)** | **තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය** | **(වි.වි.අත් පොත/පරිච්ඡේද අංක 2.2.8. 24)** |

ඉහත සඳහන් පාඨමාලා 05 ට අදාළ යෝග්‍යතා පරීක්ෂණවලට පෙනී සිටීම සඳහා අපේක්ෂා කරන අයදුම්කරුවන් ඒ ඒ පාඨමාලා යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් සුදුසුකම් සපුරාලීම අනිවාර්ය වේ. විශ්ව විද්‍යාලයීය වෙබ් අඩවිය වන (http://www.uom.lk) තුළට පිවිසීමෙන් ඉහත පාඨමාලා සඳහා අයදුම් කිරීමට සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැක.

2. විභාග පැවැත්වෙන දිනයන්

**යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය ආසන්න දිනයක දී විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි දක්වනු ලබන අතර, අයදුම්කරුවන් වෙත විද්‍යුත් තැපැල (e-mail) ඔස්සේ දැනුම් දෙනු ඇත.**

3. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම

**අයදුම්කරුවන් විසින් මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.uom.lk හි ඇතුළත් අදාළ අයදුම්පත්‍රය මාර්ගගතව (online) සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග ගෙවීම් වවුචරය සහ සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනවල පිටපත් උඩුගත (upload) කළ යුතුය.**

ඉදිරිපත් කරන අයදුම්පත්‍රය සමග ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මොරටුව විශ්වවිද්‍යාලයේ උප කුලපති නමට (ගිණුම් අංකය 306836 කටුබැද්ද ශාඛාව) නිකුත් කරන ලද ගෙවීම් වවුචරයක ස්කෑන් කරන ලද පිටපතක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

එක් පාඨමාලාවක් සඳහා රු. 1000ක මුදලක් අය කරනු ලැබේ. උදා:- ඔබ එක් පාඨමාලාවකට අයදුම් කරන්නේ නම් රු. 1000ක් ද, පාඨමාලා දෙකකට අයදුම් කරන්නේ නම් රු. 2000ක් ද, පාඨමාලා තුනකට අයදුම් කරන්නේ නම් රු. 3000ක් ද, පාඨමාලා හතරකට අයදුම් කරන්නේ නම් රු. 4000ක් ද, පාඨමාලා පහකට අයදුම් කරන්නේ නම් රු. 5000ක් ද වශයෙන් ගෙවීම් කළ යුතුය. **(චෙක්පත් සහ තැපැල්/ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)**

ස්වකීය විදුහල්පති හෝ සමාදාන විනිසුරුවරයෙකු හෝ විධායක ශ්‍රේණියේ රාජ්‍ය නිලධාරියෙකු විසින් සහතික කරන ලද අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ලේඛනවල පිටපත් සහ පොදු පරීක්ෂණය සමත් බව සහතික කළ ලේඛනයෙහි ස්කෑන් කරන ලද පිටපත් අයදුම්පත්‍රය සමග උඩුගත (upload) කළ යුතුය. වෙබ් අඩවියෙන් ලබා ගන්නා ලද අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ලේඛනය ඉදිරිපත් කරන්නේ නම් එය විදුහල්පති හෝ සමාදාන විනිසුරුවරයෙකු හෝ විධායක ශ්‍රේණියේ රාජ්‍ය නිලධාරියෙකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කර නිල මුද්‍රාව සහිතව ඉදිරිපත් කළ යුතුය.

**සැලකිය යුතුයි**

I. අයදුම්පත්‍රයෙහි සහ සහතිකවල සඳහන් නම් අතර වෙනසක් ඇත්නම් එම නම්වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බව සහතික කළ දිවුරුම් පෙත්සමක ස්කෑන් කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමග උඩුගත (upload) කළ යුතුය.

II. එක් එක් යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් වෙත අදාළ ප්‍රවේශ පත්‍ර ඔහු/ඇය විසින් පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමේදී භාවිත කළ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ දැනුම් දෙනු ඇත. එබැවින් පරීක්ෂණය සඳහා ලියාපදිංචි වීමේදී වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිත කිරීමට සැළකිලිමත් විය යුතුය.

III. අපේක්ෂකයා විසින් අවම සුදුසුකම් සපුරා නොමැති නම් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

IV. පහත දක්වා ඇති කරුණු මත ඔබේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

(අ) මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) අසම්පූර්ණ වීම.

ආ) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂිත අවම ප්‍රවේශ අවශ්‍යතා සපුරා නොතිබීම හා යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම.

V. යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම පමණක් උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවේ.

VI. අපේක්ෂකයා විසින් මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) යොමුකිරීමෙන් පසුව කිසිදු වෙනස්කමක් කිරීමට නොහැකි බැවින්, එය සම්පූර්ණ කිරීමේදී සියලු කරුණු නිවැරදි දැයි තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් අයදුම්පත්‍රය යොමුකළ යුතුය.

අදාළ ලියකියවිලි සමග මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (Online Application) 2021 ජුනි මස 25 වන දින ප.ව. 6.00ට පෙර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බාරගන්නා අවසන් දිනයට පසු ලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ.

**විශේෂ නිවේදනයයි**

යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනයට දින දෙකකට පෙර මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි පළකරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍රය හෝ වෙනත් කරුණු සම්බන්ධ පැමිණිලි හෝ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා පහත විද්‍යුත් තැපැල් ලිපිනය මගින් විමසන්න.

**ඊමේල් - admissions@uom.lk**

**ලේඛකාධිකාරී,<br>මොරටුව විශ්වවිද්‍යාලය,<br>කටුබැද්ද, මොරටුව.<br>2021.06.09**